**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2015**

**------------------------------------------------------------------------**

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ එවකට ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්පී 99 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් පුනරුත්ථාපනය කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ඇතුළු මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් නිර්මාණය කිරීමෙන් වඩා හොඳ සනීපාරක්ෂක පහසුකම් මඟින් මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 සැප්තැම්බර් 20 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ ( විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන වග.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ). 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත් ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඉදිරිපත් කර තිබුණේ 2016 නොවැම්බර් 11 දින දීය.

#### 2.2.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------------

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වගන්තිය අනුව, රු.මිලියන 5 හෝ ඊට වඩා වටිනාකම වූ කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතු වේ. තවද, කොන්ත්‍රාත්කරුට පිරිනැමීමෙන් පසු දින 60 ක් තුල කොන්ත්‍රාත් ගිවිසුම් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතු වේ. ව්‍යාපෘතිය සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹි කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු ඉහත සඳහන් අවශ්‍යතා වලට අනුකූල නොවූ බව නිරීක්ෂණය විය. මෙම කරුණ මාගේ පෙර විගණන වාර්තාවලින් අවධාරණය කර තිබුණද, රෙගුලාසි හා අනුකූල වීමට පියවර ගෙන නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා ලේඛනගත සාක්ෂි නොවීම**

---------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ලී බඩු හා සවිකිරීම් ප්‍රසම්පාදන සඳහා කොන්ත්‍රාත්කරු රු.මිලියන 3.05 ක මුදලක් වියදම්කර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා වූ උපකාර ලියවිලි සහ වෙනත් සාක්ෂි විගණනයට ලබා ගත නොහැකි විය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

------------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යයනය කිරීම සඳහා ණය ගිවිසුමේ එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ජපයෙ මිලියන. | රු. මිලියන. | රු. මිලියන. | ජපයෙ මිලියන. | රු. මිලියන. | ජපයෙ මිලියන. | රු. මිලියන. |
| ජජාසනි | 14,087 | 17,922 | 3,226 | 410.60 | 470.00 | 1,367.90 | 1,707.90 |
| ශ්‍රීලංර | 3,191 | 4,060 | 312 | 14.22 | 16.22 | 193.52 | 247.60 |
| එකතුව | 17,278 | 21,982 | 3,538 | 424.82 | 486.82 | 1,561.42 | 1,955.50 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 04 ක් ගතවීමෙන් පසුව 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් වූ මුළු වෙන් කිරීම් අතුරින් සියයට 9 ක් නියෝජනය වන රු.මිලියන 1,707.90 කට සමාන ජපන් යෙන් මිලියන 1,367.90 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ඊට අමතරව, 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද රු.මිලියන 3,538 ක් අතුරින්, සියයට 13 කට සමාන රු.මිලියන 486.22 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට උපයෝජනය කර තිබුණි.

(ආ) මාගේ පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, වෙන්කරන ලද සම්පත් භාවිතයෙන් ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට විස්තරාත්මක සැලැස්මක් ව්‍යාපෘතිය පිළියෙල කර නොමැති අතර ඒ හේතුවෙන්, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික කාර්යන්හි සියයට 16.65 ක් සහ අරමුදල් උපයෝජනය සියයට 11.36 ලෙස මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරුණි. එමනිසා 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකළ අරමුදල්මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 104.5 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවීමට සිදුවී තිබුණි.

**3.2** **භෞතික ප්‍රගතිය**

-----------------

ව්‍යාපෘතිය විසින් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තා අනුව, ප්‍රධාන පැකේජ 04 ක් යටතේ ව්‍යාපෘතියේ සිවිල් කොන්ත්‍රාත් වැඩ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 16,077 කට සමාන ජපන් යෙන් මිලියන 12,636 කට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද, පැකේජ 01 යටතේ සිවිල් කොන්ත්‍රාත් වැඩ 2015 ජුලි ඇරඹීමට අපේක්ෂා කර තිබුණද 2015 දෙසැම්බර් 31 දක්වාත් ආරම්භකර නොතිබුණි. තවද, පැකේජ 02 යටතේ සිවිල් කොන්ත්‍රාත් වැඩ 2012 ජුලි මස ඇරඹීමට අපේක්ෂා කර තිබුණද, අරඹා තිබුණේ 2015 අප්‍රේල් වූ අතර වර්ෂය අවසානයේ භෞතික ප්‍රගතිය සියයට 17 ක්ව පැවතුණි. අනෙකුත් පැකේජ 2 යටතේ වූ සිවිල් කොන්ත්‍රාත් වැඩ 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. එම නිසා අපේක්ෂිත කාල සීමාව තුළ ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ හා මිල උච්චාවචනය වීමේ අවධානම විගණනයේදී බැහැර කළ නොහැක.

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 නොවැම්බර් මාසයේදී ව්‍යාපෘතියේ පළමු අදියරය යටතේ බෝවල ප්‍රධාන පොම්පාගාරය සඳහා පිරිවැය රු. මිලියන 1.09 ක් වූ ඉඩමක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කල් බදු පදනම මත ලබාගෙන තිබුණි. කෙසේ වුවද, 2016 නොවැම්බර් 30 වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය සමග කල්බදු ගිවිසුමට එළඹීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) පරිසර හා ආරක්ෂණ කලමනාකරණ සැලසුම් අනුව ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු කරගෙන යාමේදී පරිසරයට වන අනර්ථකාරී ප්‍රතිඵල වැලැක්වීම සඳහා පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග ගත යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මාස 4 ක කාල පරිච්ඡේදයක් තුල ව්‍යාපෘතිය වෙත පැමිණිලි 119 ක් ලැබී තිබීමෙන් කොන්ත්‍රාත්කරු අවශ්‍ය ආරක්ෂිත නියමයන් පිලිපැද නොමැති බව සනාථ වේ.

**3.4** **මූල්‍ය පාලනයේ දුර්වලතා**

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 15.78 කට ව්‍යාපෘතිය ප්‍රසම්පාදනය කල දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 756 මගින් නියමකර ඇති පරිදි, සමාලෝචිත වර්ෂය තුල භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 අනුව පවත්වාගෙන යා යුතු ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.